නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - මහවිලච්චිය
திவிட திட்ட முகாமையாளர் காரியாலையம்-மகவிலச்சிய
Resident Project Management Office -Mahawilachchiya

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம்மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation& Water Resources Management

මහවිලච්චිය
පේමඩුව
மகவிலச்சிய
பெமடுவ
Mahawilachchiya
Pemaduwa

IMD

03 OCT 2017

මගේ අංකය / எனது இல. / My Ref No: 017/03/01 — ඔබේ අංකය / மது இல. / Your Ref No: — දිනය / திகதி / Date: 2017/09/22

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුරය.

## 2017 / 18 මහ කන්න රැස්වීම සඳහා දිනයක් ලබාගැනීම .

මහවිලච්චිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2017/18 මහ කන්නයේ වගා සැලසුම් සකස් කිරීම සඳහා පැවැත්විය යුතු පෙර වගා රැස්වීම 2017.09.22 වන දින ව්‍යාපාරයේ සියලුම ගොවි සංවිධාන නිලධාරි සහ රේඛීය ආයතනවල සහභාගීත්වයෙන් පැවැත්වුණි. මෙහිදී ඉදිරි මහ කන්නයේ වගා කටයුතු සිදුකිරීමට සුදුසු බවට අනුමත කරගනු ලැබූ තීරණ පහත පරිදි ඉදිරිපත් කරනු ලබන අතර, කන්නයට අදාල කන්න රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් ලබා දෙනමෙන් මෙයින් කාරුණිකව ඉල්ලා සිටිමි.

### 2017 / 18 මහ කන්නය - පෙර කන්න රැස්වීමේ තීරණ.

| | |
|---|---|
| 01. වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය | - මාස 3, 3 2/1 වී සහ අතිරේක බෝග |
| 02. වගා කරන බිම් ප්‍රමාණය | - අක්කර 2929 |
| 03. වාරි පහසුකම් සැපයීමට නියමිත ප්‍රමාණය | - අක්කර 2664 |
| 04. වගාව ආරම්භය සඳහා ජලය නිකුත් කරන දිනය | - 2017.11.01 |
| 05. වපුරා අවසන් කරන දිනය | - 2017.11.28 |
| 06. මුර ජල ක්‍රමය ආරම්භ කරන දිනය | - 2017.12.28 |
| 07. අවසන් වරට ජලය නිකුත් කිරීමට යොජිත දිනය | - 2018.02.28 |
| 08. අස්වනු නෙලා අවසන් කරන දිනය | - 2018.03.25 |
| 09. ගොවිසංවිධාන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධානඇල බෙදුම් ඇලවල් හා කෙත් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය | - 2017.10.25 |
| 10. ගොවීන් විසින් නියමිත දිනට සුද්ද පවිත්‍ර නොකරනු ලබන ඇලවල් ගොවිසංවිධාන විසින් සුද්ද පවිත්‍ර කර අවසන් කල යුතු දිනය | - 2017.10.31 |

11.වගා රක්ෂණය කර අවසන් කල යුතු දිනය - 2017.11.28

12.වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය - 2018.03.25

- 1994 අංක 13 දරණ (සංශෝධිත)වාරිමාර්ග ආඥා පනත 11 උප වගන්තිය අනුව ඉදිරි කන්නය ක්‍රියාත්මක කිරීමසඳහා යෝජිත නීති රීති

I කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 01 කට රු300.00ක මුදලක් ගොවිසංවිධානයට ගෙවිය යුතුය.එම මුදල වාරි පද්ධතියේ නඩත්තුවට පමණක් උපයෝගී කර ගත යුතුය.

( 2016 යල කනනයේ සිට මේවන තෙක් කන්න 03ක් මහවිලච්චිය ව්‍යාපාරයේ වගා කටයුතු සිදු කිරීමට නොහැකිවිය.එම නිසාවෙන් ගොවීන් විසින් සංවිධානයට ගෙවියයුතු කන්නයට අදාළ සහ හිග නඩත්තු මුදල් 2017/18 මහ කන්නයේ අස්වනු නෙලීමෙන් පසුව ලබාගැනීමට තීරණය විය)

II නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල තම පංගු කොටස සුද්ධ පවිත්‍ර නොකරන ගොවීන්ගෙන්කෙත් ඇලකට බඹයකට රු100.00කද අපවහන ඇල බඹයකට රු200.00කද හා බෙදුම් ඇල බඹයකටරු200.00කද දඩමුදලක් අයකිරීම.

III පිදුරු පිළිස්සීම වෙනුවෙන් අක්කර 01 ක පිදුරු ගොඩකට රු 1000.00ක්ද අක්කරයක අතුරා ඇති විට රු2500.00ක දඩමුදලක් අය කිරීම .

IV අයාලේ යන ගවයින් සඳහාරු1000.00 දඩමුදලක් අයකිරීම හා බෝගයන්ට හෝ වාරිමාර්ග පද්ධතියට/ඇලවේලිහෝ නිර්මිත වලට හානි කල අවස්ථා වලදී අදාල ආයතනයේ ඇස්තමේන්තු ගත මුදල දඩයක් ලෙස ගව හිමියාගෙන් අය කිරීම.

V ගොවි ආරාධනයෙන් ශ්‍රම දායකත්වය අවශ්‍ය යැයි තීරණය කරනු ලබන ඕනෑම අවස්ථාවක සාමාජිකයා ශ්‍රම දායකත්වය ලබා දිය යුතුය. සාමාජිකයාගෙන් නියෝජිතයකු සහභාගී නොවන්නේ නම් ප්‍රදේශයේ දැනට පවතින දිනකට වැටුප වන රු.1200/- ක් ද වරුවකට රු.600/- ක් ද වශයෙන් ගොවිසංවිධානයට ගෙවිය යුතුය.

..............................

එච්.එම්.එස්.බී. හේරත්,
නේවාසික ව්‍යාපාර කළමණාකරු.
මහවිලච්චිය ව්‍යාපාරය.

එච්.එම්.එස්.බී.හේරත්
නේවාසික ව්‍යාපාර කළමණාකරු
නේවාසික ව්‍යාපාර කළමණාකරණ කාර්යාලය
මහ විලච්චිය ව්‍යාපාරය
ජේමඩුව.

පිටපත්

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය | - කොළඹ | කා.දැ.ගැ.ස |
| දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ | - අනුරාධපුරය | |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | - අනුරාධපුරය | |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ( අන්තර් පළාත් ) | - අනුරාධපුරය | |
| ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් | - අනුරාධපුරය | |
| ප්‍රාදේශීය ලේකම් | - මහවිලච්චිය | |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - කෘෂි රක්ෂණ මණ්ඩලය | - අනුරාධපුරය | |
| ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | - අනුරාධපුරය | |